කොවිඩ්-19 හා ගෙවෙන මේ මොහොතේදී මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුගතව කටයුතු කිරීම ඇතැම් මාධ්‍යයන් අතින් ගිලිහී තිබේ. අප විසින් මෙහිදී තෝරාගත් පුවත්පත් කිහිපයක් මගින් 2020 ජනවාරි සිට මාර්තු මස දක්වා කාලය තුළ සාර්ස්-කොව්-2 සහ කොවිඩ්-19 සම්බන්ධයෙන් කළ වාර්තාකරණයන් තුළ වූ ජනමාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් නිරීක්ෂණය කොට ඇත.

අනවශ්‍ය ලෙසින් බිය හා තැතිගැන්ම ඇතිකරවන වාර්තාවන්,
වාර්ගිකත්වය අදාළ නොවය ලෙසින් යොදාගත් වාර්තාවන්,
කොවිඩ්-19 සම්බන්ධ දිවි අහිමි කරගැනීම් ආචාර ධාර්මික නොවන ලෙසින් පළ කෙරුණු වාර්තාවන්,
සාවද්‍ය/නොමග යවන සුළු තොරතුරු පළ කළ වාර්තාවන්.

සාවද්‍ය සහ නොමග යවන සුළු තොරතුරු ජනගත කිරීම ඇතුළු මෙම ආචාර ධර්ම උල්ලංඝනයන්, කොවිඩ්-19 මර්දන සටනටද ඇතැම් විට වක්‍රාකාරයෙන් හෝ ගැටළු ඇති කළ හැක. එසේ නොවීම සඳහා කළ යුත්තේ, සැමවිටම ආචාර ධාර්මික, වගකීම් සහගත මාධ්‍යකරණයක් පවත්වා ගැනීමයි.

#MediaEthicsSL #lka #News #COVID19 #Coronavirus
#Mawbima #SundayMawbima #Lankadeepa #SundayLankadeepa #Aruna #SathiAgaAruna #Divaina #SundayDivaina #Dinamina #Anidda #Ravaya #Silumina